" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා අප කැපවෙමු "

296

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 SYSTEM CERTIFIED

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000


| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2021 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.01.06 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මුල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2021.12.31 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | 2021.09.14<br>02-80/2021 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය විද්‍යාල සභාව විසින් වසරක් පාසා පැවැත්විය යුතු ප්‍රවීණතා ඩිප්ලෝමා විභාගය 1997 වසරේ සිට නොපැවැත්වීම හේතුවෙන් සිදුවූ අසාධාරණය නිවැරදි කිරීම පිණිස ලියාපදිංචි වෛද්‍ය සේවයේ 1 වන ශ්‍රේණියට උසස් කිරීමට ගතවන කාලය සංශෝධනය කිරීම |
| 02 | 2021.12.20<br>රා.ප. චක්‍රලේඛ 25/2021 | 2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම |
| 03 | 2021.11.22<br>රා.ප. චක්‍රලේඛ 22/2021 | රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය |
| 04 | 2021.12.24<br>රා.ප. චක්‍රලේඛ 26/2021 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර |

| | | |
|---|---|---|
| 05 | 2021.11.24<br>රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02-2021 | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් නොලබා විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා ශ්‍රේණි උසස් වීම් ලබා දීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඩබ්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 26/2021

මගේ අංකය : EST- 6/04/LON/0207

රාජ්‍ය සේවා, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය

කොළඹ 07.

2021.12.24

අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර</u>**

2015.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 26/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ 2015 වර්ෂය යන්න වෙනුවට 2021 වර්ෂය යන්න ආදේශ කිරීමට සහ 2016 වර්ෂය ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම 2022 වර්ෂය යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2022 වර්ෂයට රු. 4,000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2022.01.01 දිනෙන් ආරම්භ කර 2022.02.28 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2022.02.28 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතු ය. මෙම අත්තිකාරම් මුදල 2022 වර්ෂය තුළ දී ම අයකර අවසන් කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ.ජේ.රත්නසිරි

ලේකම්

රාජ්‍ය සේවා, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශය